**අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය - 2015**

---------------------------------------------------------------------

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1984 අංක 11 දරන අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය පනතේ 12 (4) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමණාකරණයේ වගකීම

---------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමණාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැළකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමණාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

**ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වත්කම් අයිතමය හා ආශ්‍රිත අනාගත ප්‍රතිලාභ හෝ සේවා ශක්‍යතාවය ඇති විට ඒවා වෙනම හඳුනාගත යුතු වුවත් මණ්ඩලයේ ඉඩම් සම්බන්ධයෙන් එසේ කර නොතිබුණි.

(ආ) ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති 2.1 අනුව වත්කම් පිරිවැයට හෝ තක්සේරු වටිනාකමට පෙන්වා ඇති බව සඳහන් වුවද පිරිවැයට හා තක්සේරු වටිනාකමට හඳුනා ගන්නා ලද වත්කම් පන්ති පිළිබඳ අනාවරණය කර නොතිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති 2.2 අනුව ඉඩම් සහ ගොඩනැඟිලි වෙන්ව හඳුනා නොගෙන ඉඩම් සඳහා සියයට 5 ක් බැගින් ක්ෂය කර තිබුණි.

#### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

2015 වර්ෂය අවසානයට ගෙවිය යුතුව තිබූ එකතුව රු. 1,136,503 ක වියදම් උපචිත වියදම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

#### 2.2.4 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) එකතුව රු.356,813 ක්වූ තැන්පතු සම්බන්ධයෙන් කාල විශ්ලේෂණ විගණනයට ඉදිරිපත් කර නොතිබුණු අතර ඉන් බාහිර ආයතන 18 ක තැන්පත් කරන ලද රු.295,313 ක් වටිනා තැන්පතු පිළිබඳ ලදුපත් මණ්ඩලය සතු නොවූ බැවින්, එම තැන්පතු මුදල් කර ගැනීම පිළිබඳ අවදානමක් පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව වර්ෂ 10 කට අධික කාලයක් පවතින එකතුව රු.1,782,060 ක් වූ විවිධ අත්තිකාරම් 16 ක් අයකරගෙන නොතිබුණි.

**2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම**

---------------------------------

වටිනාකම රු.2,971,405 ක් වූ හෝමාගම පිටිපන ඉඩම සඳහා හිමිකම් සහතික හා රු.1,425,000 ක් වූ පරිගණක මිලදී ගැනීම් සඳහා වූ බිල්පත් විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි.

**2.2.6 පැහැදිලි නොකළ වෙනස්කම්**

------------------------------

මූල්‍ය ප්‍රකාශන අනුව ස්ථාවර වත්කම් හා උපලේඛනයේ එකතු ශේෂ අතර රු.15,251,102 ක වෙනසක් පැවතුණි.

**2.3 නීති රීති, රෙගුලාසි සහ කළමණාකරණ තීරණ වලට අනුකූල නොවීම**

---------------------------------------------------------------------------

පහත සඳහන් නීති රීති, රෙගුලාසි සහ කළමණාකරණ තීරණ වලට අනුකූල නොවීම් අවස්ථා නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1984 අංක 11 දරන අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩල පනත | ආයතනයේ පාලක මණ්ඩලයේ සාමාජිකයන් වන පොලිස්පති නම්කළ නියෝජිත, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් නම්කළ නියෝජිත හා ශ්‍රී ලංකා රේගුව නම්කළ නියෝජිතයන්ගේ පැමිණීම සියයට 30 ක අඩු මට්ටමක පැවතුණි. |
| (ආ) 2007 අංක 54 දරන ඖෂධ වලට ඇබ්බැහි තැනැත්තන් (ප්‍රතිකාර හා පුනරුත්ථාපනය කිරීම) පිළිබඳ පනතේ 4(3) වගන්තිය | පුද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන විසින් සිදුකරනු ලබන ප්‍රතිකාර පිළිබඳ සාර්ථකභාවය සම්බන්ධයෙන් ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථාන අධ්‍යක්ෂක විසින් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු කාලීන වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 109 (1)(ආ) | වාහන අනතුරු සම්බන්ධයෙන් වූ පොතෙන් අස් කිරීමේ සෑම නියෝගයකම පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 371(2)(ඇ) | සමාලෝචිත වර්ෂය තුළදී ආයතනයේ නිලධාරීන් වෙත අවස්ථා 41 දී ලබාදී තිබූ එකතුව රු.476,325 ක් වූ අත්තිකාරම් පියවීම සඳහා දින 14 සිට දින 261 ක් දක්වා වූ කාලයක් ගතකර තිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 751 | සියලු භාණ්ඩ ලැබීම් හා නිකුත්කිරීම් නිසි පරිදි භාණ්ඩ ලේඛනවල ඇතුළත් කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

--------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.14,110,836 ක ඌනතාවක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.15,906,625 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,795,789 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙහෙයුම් වියදම් රු. 29,658,161 කින් වැඩි වී තිබුණද රජයේ දායකය හා අනෙකුත් ආදායම් රු. 31,453,952 කින් වැඩි වී තිබීම මෙම මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

ඉකුත් වර්ෂවල මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී අඛණ්ඩ මූල්‍ය ඌනතාවයක් ඇති වී තිබුණි. සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් සැලකිල්ලට ගැනීමේදී මණ්ඩලයේ දායකත්වය 2011 වර්ෂයේ සිට අඛණ්ඩව වර්ධනය වී තිබුණු අතර 2013 වර්ෂයේ සිට 2015 දක්වා පිළිවෙලින් රු.67,539,371, රු.76,486,442 හා රු.110,609,846 ක දායකත්වයක් විය. ඒ අනුව 2015 වර්ෂයේ දායකත්වය ඉහළ  අගයක් පෙන්නුම් කළ නමුත් ඊට පෙර වර්ෂවලදී ඒ මට්ටමින් පවත්වාගෙන ගොස් නොතිබුණි.

### 3.2 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

-------------------------------------

2015 දෙසැම්බර් 31 දිනට බැංකු ජංගම ගිණුම් 6 ක එකතුව රු.6,309,030 ක  මුදල් ඵලදායී කාර්යයක යෙදවීමකින් තොරව  වර්ෂ ගණනාවක සිට අක්‍රීයව පැවතුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

### 4.1 කාර්යසාධනය

-----------------

1984 අංක 11 දරන අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය පනතේ අරමුණු පහත දැක්වේ.

* අන්තරායකර ඖෂධ නිවාරණ හා පාලනය කිරීම සම්බන්ධව ජාතික ප්‍රතිපත්තියක් සැකසීම හා සමාලෝචනය කිරීම සහ එවැනි ප්‍රතිපත්ති පිළිබඳව ජාතික ප්‍රතිපත්තියක් සැකසීම හා සමාලෝචනය කිරීම එවැනි ප්‍රතිපත්ති පිළිබඳව අමාත්‍යවරයාට උපදෙස් හා නිර්දේශ ඉදිරිපත් කිරීම.

* මණ්ඩලයේ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා දේශීය හා විදේශීය මූලාශ්‍ර වලින් පරිත්‍යාග හා ආධාර භාර ගැනීම.

* අන්තරායකර ඖෂධ නිවාරණ හා පාලයේ නිරතව සිටින නියෝජිතායතනවල කටයුතු සම්බන්ධීකරණය.

* මත්ද්‍රව්‍ය වලට අබ්බැහිවූ පුද්ගලයන් සඳහා ප්‍රතිකාර හා පුනරුත්ථාපන කටයුතු වැඩි දියුණු කිරීම සහ ළමුන් හා වැඩිහිටි පුද්ගලයන් සඳහා ජාතික මත්ද්‍රව්‍ය භාවිතය හා නිවාරණය පිළිබඳ අධ්‍යයන වැඩසටහන් පැවැත්වීම.

* අන්තරායකර ඖෂධ භාවිතය ව්‍යාප්තිය, ඒ සඳහා හේතු හා අන්තරායකර ඖෂධ භාවිතයෙන් ඇති වන නෛතික, වෛද්‍ය, සාමාජීය, සංස්කෘතික හා ආර්ථික ගැටළු පිළිබඳ පර්යේෂණ අධ්‍යයන පැවැත්වීම හා ඒ සම්බන්ධ කටයුතු ඉටු කිරීමට භාරගැනීම, ඖෂධ පාලන කටයුතු වල නියැලී සිටින ජාතික කලාපීය හා අන්තර් ජාතික සංවිධාන හා නියෝජිතායතන සමඟ සම්බන්ධීකරණය පවත්වා ගැනිම.

ඉහත අරමුණු ඉටුකර ගැනීමට අදාළ පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රතිකාර සඳහා පුනරුත්ථාපන මධ්‍යස්ථානයට ඇතුළත්වන සේවාලාභීන් ආයතනයෙන් බැහැර වූ විට ආයතනය මගින් සහ බාහිර සේවා නිලධාරින් මගින් (Outreach Officer) ඔවුන් පිළිබඳව සිදු කරනු ලබන පසු විපරමේදී සේවාලාභීන්ගෙන් වැඩි ප්‍රමාණයක් නැවතත් මත්ද්‍රව්‍ය භාවිතයට නැඹුරුවීම, මධ්‍යස්ථානයටම නැවත පුනරුත්ථාපනය සඳහා පැමිණීම හෝ ඔවුන් පිළිබඳ තොරතුරු නොමැති තත්ත්වයක් පැවතුණි.

(ආ) 2015 සැප්තැම්බර් 12 දින ඇතුළත් වූ සේවා අංක 10060 දරන සේවාලාභියාගේ පසු රැකවරණ වාර්තාව නිරීක්ෂණයේදී නේවාසික වී මාස 2 සති 2 ක් දක්වා කාලයක් ගත වුවද, සේවාලාභියා සමඟ එක් වරක්වත් උපදේශන සඳහා යොමු වී නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

------------------------------------

සෞඛ්‍ය අමාත්‍යාංශය සතු ගොඩනැගිල්ලක කුලී ගෙවීමකින් තොරව තලංගම ප්‍රතිකාර නිවාරණ මධ්‍යස්ථානය පවත්වා ගෙන යන අතර ගොඩනැගිල්ල සහ ඉඩම පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ජෙනරේටරයක්, කාර්යාල උපකරණ, ගෘහ උපකරණ හා පරිගණක මිලදී ගැනීම වෙනුවෙන් ගෙවන ලද එකතුව රු. 5,074,427 ක් වූ සම්පූර්ණ මුදලම ගෙවා තිබියදී එය මූල්‍ය ප්‍රකාශනවල කොටස් ගෙවීමක් ලෙස දක්වා තිබුණි. මෙම භාණ්ඩ මණ්ඩලය වෙත නොලැබී ඇති බැවින් ක්ෂය කළ නොහැකි නිසා මෙම ගෙවීම් කොටසක් ගෙවීම් ලෙස සටහන් කර ඇති බව සභාපතිවරයා දැනුම් දී ඇත.

(ආ) සේවා මධ්‍යස්ථානයේ නේවාසික ප්‍රතිකාර සඳහා 2015 වර්ෂයේ ජනවාරි සිට අගෝස්තු 25 දක්වා සේවාලාභීන් 272 ක් ඇතුළත් වී තිබුණු අතර ඉන් සේවාලාභීන් 43 දෙනෙකු අනවසරයෙන් බැහැර වී තිබුණි.

(ඇ) 2015 වර්ෂයේ ගාස්තු නොගෙවා නේවාසික වූ සේවාලාභීන් 146 කින් 45 දෙනෙකු නැවත ප්‍රතිකාර සඳහා ඇතුළත්වූ සේවාලාභීන් විය. එය ප්‍රතිශතයක් ලෙස සියයට 30 ක ප්‍රමාණයක් විය.

(ඈ) 2015 වර්ෂය තුළදී තලංගම මධ්‍යස්ථානයේ උපදේශකවරුන් හා සහකාර උපදේශකවරුන් 9 දෙනෙකු විසින් සේවාලාභීන් සමඟ උපදේශන සිදුකළ අවස්ථා ගණන අනුව එම නිලධාරීන් මාසයකට උපදේශන සේවා අවස්ථා ගණන ආසන්න වශයෙන් 8 ක් පමණක් වූ අතර එය ප්‍රමාණවත් නොවන බව විගණනයේදී නිරීක්ෂණය විය.

**4.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

නිශ්චිත පරමාර්ථයකින් තොරව 2014 වර්ෂයේ දී රු.2,971,405 කට මිලදී ගෙන තිබූ හෝමාගම පිහිටි පර්චස් 40 ක ඉඩම ඵලදායී කාර්යයක යොදා ගැනීම සම්බන්ධයෙන් විධිමත් සැලසුමක් මණ්ඩලය විසින් පිළියෙල කර නොතිබුණි.

**4.5 කාර්ය මණ්ඩල පරිපාලනය**

2011 වර්ෂයේ සිට සහකාර මූල්‍ය අධ්‍යක්ෂ තනතුර පුරප්පාඩුව පැවතුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 අභ්‍යන්තර විගණනය**

මණ්ඩලය සඳහා වෙනම අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබූ අතර රේඛීය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය විසින් විගණන කටයුතු සිදුකර තිබුණි. එහෙත් අභ්‍යන්තර විගණන වැඩසටහන හෝ අභ්‍යන්තර විගණන වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**5.2 ප්‍රසම්පාදන සැලැස්ම**

ප්‍රසම්පාදන සැලැස්මේ ඇස්තමේන්තු වටිනාකමට වඩා සියයට 81 ක් එනම් රු.40,961,000 ක් අඩුවෙන් වැයකර තිබූ බැවින් ප්‍රසම්පාදන සැලැස්ම තාත්විකව පිළියෙල කර නොතිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

**5.3 අයවැය ලේඛනමය පාලනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ අයවැයගත ආදායම් හා වියදම් තථ්‍ය ආදායම් හා වියදම් සමග සැසඳීමේදී විෂයයන් 29 කට අදාළව සියයට 96 සිට සියයට 783 ක් දක්වා වූ විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

(ආ) අයවැය ඇස්තමේන්තු සකස් නොකරන ලද වියදම් විෂයයන් 12 ක් සඳහා එකතුව රු.12,844,147 ක් සමාලෝචිත වර්ෂයේදී වැය කර තිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට වරින්වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) ගිණුම්කරණය | මූල්‍ය ප්‍රකාශන හා ගිණුම් පොත්පත් නිවැරදිව පිළියෙල නොකිරීම ජ'නල් සටහන් සඳහා අනුමැතිය ලබා ගෙන නොතිබීම. |
| (ආ) පුනරුත්ථාපන මධ්‍යස්ථාන උපයෝජනය | මධ්‍යස්ථානවලට පැමිණෙන සේවාලාභීන් සඳහා ප්‍රමාණවත් සේවාවක් නොසැපයීම. |

| | | |
|---|---|---|
| (ඈ) | වත්කම් පාලනය | ස්ථාවර වත්කම් ලේඛන විධිමත්ව නඩත්තු නොකිරීම. |
| (ඈ) | තොග හා ඉන්වෙන්ට්‍රි පාලනය | ඉන්වෙන්ට්‍රි ලේඛන නිවැරදිව පවත්වා ගෙන නොයාම. |
| (ඉ) | මූල්‍ය කළමනාකරණය | අක්‍රීය බැංකු ගිණුම් වල ඉහළ වාසිදායක ශේෂ පවත්වා ගැනීම, භාණ්ඩ ලැබීමට පෙර මුදල් ගෙවීම. |
| (ඊ) | මානව සම්පත් කළමනාකරණය | අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබීම. |